**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
7, Stuart Place
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## ශිෂ්‍ය ව්‍යාපාරය තනි නොකළ යුතු ය

ගත වූ මාසය පුරාම රටේ ජනතාවගේ අවධානයට ලක් වූ අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ඇති වූ අර්බුදකාරී තත්වයත් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල සෑම එකකම පාහේ මතුවී තිබූ නොසන්සුන්තාවත් පිළිබඳව මෙරට වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රතිචාර අලස හා නිද්‍රාශීලී වීම පිළිබඳව අපට ඇතිවන්නේ කණගාටුවකි. ක්‍රියාත්මකවීම කෙසේ වෙතත් අවම වශයෙන් ඒ පිළිබඳව කිසියම් වූ කතිකාවක් හෝ ඇති කිරීමට උත්සාහයක් වත් නොගැනීම පිළිබඳව නිදහස් අධ්‍යාපනයේ උරුමයන් භුක්ති විඳි පුද්ගලයන් වශයෙන් අප කණගාටු විය යුතු ය.

රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා කීපයක් පුවත්පත් පත් සඟරා සක්‍රියව පවතින ඔස්ට්‍රේලියානු සමාජය තුළ ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂෙත්‍රයේ වැදගත්ම ඒකකයක් වන සරසවි පද්ධතිය හා ඊට අදාල ගැටළු පිළිබඳව විචාරශීලී අදහසක්වත් ප්‍රකාශ නොවීම ම නොරට වෙසෙනෙ අපගේ දේශප්‍රේමීත්වය මනාව හෙළිදරව් කරයි.

ක්ෂිතිජයට ඉහළින් ලොව දකින මිනිසුන් බිහි කිරීම තේමාවට ගෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණය මුවාවෙන් අධ්‍යාපන ඇමතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව මේ සැරසෙමින් සිටින්නේ නිදහස් අධ්‍යාපන අයිතීන් කප්පාදු කර අධ්‍යාපනය වාණිජකරණයට ලක්කිරීම බව ඉතා පැහැදිළිය.

සරළව ගතහොත් වත් පොහොසත් කම් නැති දරුවනට අධ්‍යාපනයට ඇති අවස්ථා අවම කිරීමට ය. මේ කාරණය අපේ සමාජයට කොතරම් දුරට දැනී ඇද්දැයි යන්න වෙනමම ගැටළුවකි. සමාජය තුළ ආන්ඩුවට පක්ෂ හා ස්වාධීන යයි පැවසෙන බොහෝ දෙනා විවිධ අලංකාර වදන් තුළින් මේ කාරණය සුබවාදී ලෙස විග්‍රහ කළත් ඊට යටින් දිවෙන යථාර්ථය ඊට වඩා බරපතළ බව අප තේරුම් ගත යුතු ය.

81 අධ්‍යාපන ධවල පත්‍රිකාවේ සිට රාගම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය 85 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පනත 2008 පාසල් නගාසි-ටුවීමේ පනත් හරහා මේ අරමුණු ක්‍රියාත්මක කිරීමට පැවති රජයන් උත්සාහ දැරුවත් දෙමව්පියන් ගුරුවරුන් ලෙස අප නිහඬව සිටිද්දී මේ සියලු උත්සාහයන් පරාජය කරනු ලැබුවේ ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ සටන් මැදිහත්වීම තුළින් බව නැවත නැවතත් මතක් කර දිය යුතු ය.

ඇතමුන් සඳහන් කරන පරිදි ශිෂ්‍ය ව්‍යාපාරය හිතුවක්කාර දඩබ්බර ව්‍යාපාරයක් නොවේ. අඩුපාඩුකම් තිබුණද එයට කීර්තිමත් ඉතිහාසය-ක් ඇත . මේ ශිෂ්‍ය සටන් ව්‍යාපාරය හරහා ලංකාව තුළ පසුගාමීව තිබූ සමාජ ව්‍යාපාරයන් ලැබූ උත්තේජනය සුළු පටු නොවන වගත් සඳහන් කළ යුතමය. එහෙයින් අප ඔබෙන් ඉල්ලා සිටින්නේ අධ්‍යාපන ක්ෂෙත්‍රයේ සිදුවන මේ ක්‍රියාවලිය හා ඊට එරෙහිව ශිෂ්‍ය ව්‍යාපාරය නගනා හඬ පිළිබඳව අවධියෙන් සිටිනා ලෙස ය. ඒ සඳහා ඔබද දායක විය යුතුය. ඒ ඔබ වෙනුවෙන් නොව රටේ මීළඟ පරපුරට නිදහස් අධ්‍යාපනය රැක දෙනු සඳහාය.

සංස්කාරක - සන්නස



# අධිකරණය, පොලීසිය හා රාජපක්ෂ ආණ්ඩුවේ වල්වැදුණු නීතිය

ශ්‍රී ලාල් ප්‍රියන්ත

දේශපාලන, ආර්ථික, සමාජික හා සංස්කෘතික ව්‍යුහය නිවැරදි ආකාරයට සුරක්ෂිත කිරීම උදෙසා නීතියේ යහපැවැත්ම ඉතාමත් අත්‍යවශ්‍ය කාර්ය භාරයක් සිදුකරුණු ඇත. යම් හෙයකින් කිසියම් රටක නීතිමය සිද්ධාන්ත නිසිලෙස රට තුළ ක්‍රියාත්මක නොවන්නේ නම්, ඉන් මුළු සමස්ත සමාජයටම ඇතිවන බලපෑම සුළුපටු නොවේ. සත්‍යයේ සැබෑ විවරණය එයයි.

අපට කිසියම් පුද්ගලයකු ගෙන්, පිරිසක ගෙන් හෝ සංවිධානයකින් අයුක්තියක්, අසාධාරණයක් සිදුවූ විට සාධාරණය ඉෂ්ඨ සිද්ධ කර ගැනීම උදෙසා යෑමට ඇති එකම ස්ථානය පොලීසිය හා අධිකරණය පමණි. මූලික වශයෙන් පොලීසියට ගොස් ප්‍රශ්න ගත කරුණකට විසඳුමක් ලබා ගැනීමට අපහසු වුවහොත්, ඊළඟට අපට යෑමට ඇති එකම ස්ථානය අධිකරණය පමණි. එහි විරාජමානව සිටින ''ගරු කටයුතු යැයි'' කියන විනිසුරුවරු පැමිණිල්ලේ හා විත්තියේ කරුණු කාරණා පිළිබඳව පූර්ණ විමර්ශනයක් සිදුකර කිසිම පාර්ශ්වයකට අගතියක් සිදුනොවන ආකා-ාරයට තීන්දුවක් දෙනු ඇතැයි අප කාගේත් පූර්ණ විශ්වාසය වනු ඇත.

මෙලෙස කල්පනා කර බලන කළ ශ්‍රී ලංකාවේ නීතියේ යුක්ති සහගත භාවය කොතෙක් දුරට සර්ව සාධාරණ අපක්ෂපාතී භාවයකින් යුතුව ක්‍රියාත්මක වන්නේද, යන්න විමසුමකට භාජනය කිරීම ඉතාමත් වැදගත් කාරණයකි. අප දන්නා ආකාරයට අතීතයේ සිටම පොලීසිය පැවැතුණේ පවතින ආණ්ඩුවේ අත කොළුවක් ලෙසය. ඒ තුළින් යුක්තිය ඉෂ්ඨ කර ගැනීම යනු භාවා සඳ දකින්නාසේ ඉතාමත් අපහසු දෙයකි.

පොලීසියේ නීතියේ ආධිපත්‍ය කඩා වැඩීමේ එක් සන්ධිස්ථානයක් සනිටුහන් වන්නේ 1977 දී ජේ.ආර්. ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් යුතුව එක්සත් ජාතික පක්ෂය බලයට පත් වීමත් සමඟය. එම ආණ්ඩුව ප්‍රතිවාදින්ව මර්දනය කිරීම උදෙසා ඉතාමත් තිරිසන් ආකාරයට යොදා ගත් බව අතීතය දන්නා අයට අමුතුවෙන් කිවයුතු දෙයක් නොවේ. පොලීසිය මේ හරහා එක්සත් ජාතික පක්ෂ පාලනය තුළ බරපතළ පිරිහීමකට ලක්වී තිබිණි.

එම තත්ත්වය වර්තමානය වනවිට පවතින්නේ ඉතාමත් ඉහළ තලයකය. අද පොලීසිය යනු මහින්ද රාජපක්ෂ සහෝදර සමාගමේ පෞද්ගලික බූදලයකි. පොලීසියේ සියලු කටයුතු සිදුවන්නේ සහෝදර සමාගමේ අවශ්‍යතා උදෙසාය. කිසියම් රටකට ඇත්තේ එකම එක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. ඉන් ස්ථාපිත එකම නීතිමය පද්ධතියකි. කාටත් යුක්තිය හා සාධාරණත්වය ඉටු කරන්නෙ එම නීතිමය පද්ධතිය මගින් ව්‍යවස්ථාපිත නීතිමය රාමුව තුළ පිහිටුවාය. ඉන් පිට ක්‍රියා කිරීමේ හැකියාවක් කිසිවෙකුටත් නැත.

උස්මිටි, මිල මුදල්, තාන්න මාන්න, ගරු නම්බුනාම හෝ වරදාන වරප්‍රසාද නීතියට අදාළ නැත. කාටත් සළකන්නේ එකම හැන්දෙන්ය. රටේ උත්තරීතරම ආයතනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. එයට පිටුපා ක්‍රියා කිරීමේ හැකියාවක් අප කිසිවෙකුටත් නැත.

සත්‍යයේ කතා පුවත එසේ වුවත්, මෙම සැබෑ සත්‍යය අද රට තුළ ක්‍රියාත්මක වන්නේ නැත. රටේ උත්තරීතර නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වුවත්, වර්තමානයේ ක්‍රියාවට නඟා ඇත්තේ රාජපක්ෂ සහෝදර සමාගමේ නීතියයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින්ම සහතික කර ඇති ආකාරයට කිසියම් පුද්ගලයකුට නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට හා ඒ සඳහා ක්‍රියාත්මක වීමට අයිතිය ඇත. එය මානව අයිතිවාසිකමකි.

නමුත් රාජපක්ෂ සහෝදර සමාගමේ අත්තනෝමතික ක්‍රියා මාර්ග වලට එරෙහි වුව-හොත්, සිදුවන්නේ තමන්ගේ අතකොළුවක් ලෙස ක්‍රියා කරන පොලීසිය යොදා එම පිරිස් ඉතාමත් තිරිසන් ආකාරයට මර්දනය කිරීමය. පෞද්ගලික විශ්‍රාම වැටුප් පනතට එරෙහිව කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ඇඟලුම් කම්හල් සේවක සේවිකාවන් අරගල කළ මොහොතේ පොලීසිය යොදා ඔවුන්ට තිරිසන් ලෙස වෙඩි ප්‍රහාර එල්ල කරමින් රාජපක්ෂ ආණ්ඩුව තිරිසන් ක්‍රියාවලියක නියැලිණි. ඉන් රොෂාන් චානක සේ-වකයා මිය ගොස් තවත් කිහිප දෙනෙකු බරපතළ තුවාල ලැබූහ. ඔහුව මරා දැමුවා පමණක් නොව, ආණ්ඩුව ඔහුගේ දේහයට අවසන් ගෞරව දැක්වීම උදෙසා පැමිණෙන අයට පවා තහංචි පැනවීය. එනම්, රාජපක්ෂ සහෝදර සමාගමේ පොලීසිය අධිකරණය

4 වන පිටට